ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය

# "කි.මී 100,000 මාර්ග සංවර්ධන වැඩ සටහනට අනුව සෘජු කම්කරු ශ්‍රමය යටතේ ක්‍රියාත්මක ගාල්ල බද්දේගම මාර්ගයේ කි. මී. 7+560 සිට 8+100 දක්වා මාර්ග කොටස වැඩි දියුණු කිරිම.

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරු (ගාල්ල) කාර්යාලයිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කි.මී 100,000 මාර්ග සංවර්ධන වැඩ සටහනට අනුව සෘජු කම්කරු ශ්‍රමය යටතේ ක්‍රියාත්මක ගාල්ල බද්දේගම මාර්ගයේ කි.මී. 7+560 සිට 8+100 දක්වා මාර්ග කොටස වැඩි දියුණු කිරිමට අවශ්‍ය ABC සපයා ගැනීම සඳහා පහත පරිදි සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

| විස්තරය | ඒකකය | අවශ්‍ය ප්‍රමාණය | කොන්දේසි |
|---|---|---|---|
| ABC(Dense Graded) සැපයීම (37.5 mm) | කියුබික් මීටර් | 2550 | තත්ව පාලනය ICTAD Publication No SCA/5 ට අනුව සිදු කළ යුතුය. |

01. මිළ ගණන් කැඳවීම ජාතික තරගකාරි ලංසුකරන පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

02. මිළ ගණන් පත් ගෙවීමකින් තොරව "ප්‍රධාන ඉංජිනේරු (ගාල්ල), මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව,ගාල්ල" වෙතින් පරික්ෂා කර බැලිය හැකිය.

03. මේ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් 2023.04.25 දින සිට 2023.05.09 දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ එක් මිළගණන් පතක් සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 1000.00 (වැට් බදු රහිත) ගාස්තුවක් බැගින් සහ ලිඛිත අයදුම්පතක් "ප්‍රධාන ඉංජිනේරු (ගාල්ල), මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව,ගාල්ල" වෙත ඉදිරිපත් කිරීමෙන් මිළ ගණන් ඉදිරිපත් කිරිමට අදාල අයදුම්පත් ලබාගත හැකිය.

05. කාර්යාලයට පැමිණ මිළ කැඳවුම් පත් ලබා ගත නොහැකි සැපයුම්කරුවන් හට cegalle.rda@gmail.com වෙත ඊ මේල් පණිවිඩයක් යොමු කිරිම මගින් අයදුම්පත් ගෙන්වා ගත හැකි අතර ඔවුන් එම මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගෙන එය ද මිළ ගණන්පත් සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන මිළ ගණන් ප්‍රතික්ෂේප වේ. (දු.ක අංක 0912234891).

06. සම්පූර්ණ කළ මිළගණන් පත් 2023.05.10 දින ප.ව. 02.00 ට පෙර "ප්‍රධාන ඉංජිනේරු (ගාල්ල), මාර්ග සංවර්ධන අධිකාරිය, කොටුව,ගාල්ල" යන ලිපිනයට ලි.ප.තැපැල් මගින් එවීම හෝ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන මිළ ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිළ ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ලංසු කරුවන් හෝ ඔවුන්ගේ . නියෝජිතයන් ඉදිරියේ එකී මිළ ගණන් විවෘත කරනු ලැබේ.

07. ඔබගේ මිළ ගණන් පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරෙහි "ABC සැපයුම් කිරිම - ගාල්ල බද්දේගම මාර්ගය"යනුවෙන් සඳහන් කළ යුතුය.

**සභාපති**
**ප්‍රසම්පාදන කමිටුව**
**ප්‍රධාන ඉංජිනේරු( ගාල්ල)**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**කොටුව, ගාල්ල**